


**ජාත්‍යන්තරය සමඟ ගැටෙනු වෙනුවට ඔවුන් සමඟ උපක්‍රමික ලෙස ගනුදෙනු කළ හැකි රාජ්‍ය තාන්ත්‍රිකයන්ගෙන් සන්නද්ධ විය යුතු මොහොතක කුපිත වූ දේශපාලන චන්ඩීන්ගෙන් හා කවට කතිකයන්ගේ සටන්පාඨ රජයේ මතයක් ලෙස ප්‍රකාශයට පත්වීම කණගාටුවට කරුණකි.**

ශ්‍රී ලංකා රජයට එරෙහිව නැගෙන යුධ අපරාධ චෝදනාව දැන් දැන් වඩාත් සංවිධානාත්මක ස්වරූපයෙන් ඉදිරිපත්වන අයුරු දැක ගත හැකිය. කොටි හිතවාදීන් විසින් තම මතවාදයට නතුකොටගෙන ඇති ජාත්‍යන්තර බලවේග මෙම පුවතට ඉහළ ප්‍රචාරයක් ලබාදෙමින් සිටියි. ලොව බලවත් රටවල් විසින් සිදුකොට ඇති හා සිදුකරමින් සිටින මානව අයිතීන් උල්ලංගනය කිරීම්වලදී ඊට මානුෂවාදී ලේබල් අලවන මෙම ජගත් මාධ්‍ය පරිහරනය කරනු දකගත හැකිවිය. **ප්‍රතිඵලය වූයේ පශ්චාත් යුධ සමයේ අභියෝග වෙත එක්සත්ව මුහුණ දීමට තිබූ මහඟු අවස්ථාව ගිලිහී යාමයි.** මෙම අවකාශය විදෙස් සතුරන් තම විරුද්ධ මතවාද මුවහත් කරගැනීමට හොඳ අවස්ථාවක් කොට ගත්හ. එනම් යුධ ජයග්‍රහණයට උරදුන් පිරිස් අතරම ඇතිවූ ප්‍රතිවිරෝධතාවයන් සූක්ෂම ලෙස පරිහරණය කළ කොටි හිතවාදී රටවල් තම උපරිම වෙර යොදා යුධ අපරාධ චෝදනා කරළියට ගෙනාවේය.

යෝජනා ලේඛනය තුළ රටේ උත්තරීතර ආයතනයට පත්වීමට තරම් සුදුසු කම් සපුරා තිබූ පිරිස අතලොස්සක් වීමයි. එය යද්ධයෙන් පසු ජය ගත යුතු අභියෝග හමුවේ සුබ දසුනක් නොවුණි. අවසානයේ නැවතත් ප්‍රසිද්ධ මැරයන් මත්ද්‍රව්‍ය වෙළෙන්දන්, මත්පැන් සැල් හිමිකරුවන්, දූෂිත ව්‍යාපාරිකයන්, පැවති රජයන් යටතේ දූෂන චෝදනාවන්ට ලක්වූවන් රාශියකින් නැවතත් සිය මුදල් බලයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වන්නට අවස්ථාව උදාකර ගත්තේය. තිහට අඩු කරන බවට සපත කළ අමාත්‍ය මඩුල්ලද යළි රටට ඉසිලිය නොහැකි තරමට වර්ධනය විය. මහින්ද චින්තනයට එකඟ නොවන දේශපාලන ගමන ඇරඹුනේ ඒ අයුරිණි.

**එනම් මෙම දූෂිත දේශපාලන සංස්කෘතිය රිසි සේ වෙනස් කළ හැකිව තිබූ පළමු මංසංධිස-**

ඉල්ලා සිටි දූරදර්ශී දේශපාලන පිළිවෙත එය නොවේ.

ජාතික ගැටලුවට සුදුසු දේශපාලන විසඳුමක් පිළිබඳව පුළුල් සංවාදයක් ඇතිකොට ඊට කඩිනම් ආරම්භයක් ලබාගත්තේ නම් මෙම විදෙස් අතපෙවීම් මෙතරම් ප්‍රබල නොවන්නට ඉඩ තිබුණි. විදෙස් අතපෙවීම් එනතෙක්ම රජය එය අතපසු කළේය. එමෙන්ම උතුරු නැගෙනහිර ජන ජීවිතය යථා තත්ත්වයට පත්කොට විනිවිද භාවයෙන් යුතු ආර්ථික පිළිවෙතකට රජය විතැන්විය යුතුව තිබුණි. එහෙත් එවැන්නක් තවමත් දැකගත නොහැකිය. යුද්ධය හේතුවෙන් ගොඩ නැගිය නොහැකව තිබූ ආර්ථිකය යුධ සමයටත් වඩා නරක දිශාවට ගමන් කරමින් තිබියදීත් රට තුළ නාස්තිය දූෂණය අවම වන දේශපාලන තීන්දු තීරණ ගැනෙන බවක් දැක ගත නොහැකිය.

රාජ්‍ය පාලකයන් ඉහත දුර්වලතා ප්‍රකට කරන වටපිටාවක බිඳවැටෙන එක්සත් භාවය මතින් දැන් බලවත් රටවල දේශපාලනය තෙරපුමකට ද රජයට මුහුණ දීමට සිදුව තිබේ. එයට එක්සත්ව හා එක්සිත්ව මුහුණ දිය යුතු පිළිවෙතකට රජය ප්‍රවේශ වන බවක් නොපෙනේ. **දේශීය ස්වයංපෝශිත ආර්ථිකයකට හිමිකම් නොකියන ශ්‍රී ලංකාව වැනි රාජ්‍යකට ඉන් ඇතිවිය හැකි භයානක ප්‍රතිවිපාක පිළිබඳ රජයට අවබෝධයක් නැති තරම්ය. ජාත්‍යන්තරය සමඟ ගැටෙනු වෙනුවට ඔවුන් සමඟ උපක්‍රමික ලෙස ගනුදෙනු කළ හැකි රාජ්‍ය තාන්ත්‍රිකයන්ගෙන් සන්නද්ධ විය යුතු මොහොතක කුපිත වූ දේශපාලන චන්ඩීන්ගෙන් හා කවට කතිකයන්ගේ සටන්පාඨ රජයේ මතයක් ලෙස ප්‍රකාශයට පත්වීම කණගාටුවට කරුණකි.** අවසානයේ එහි අහිතකර ප්‍රතිඵල බුක්ති විඳිනුයේ ඊට වග නොකිව යුතු ජනතාව බව අවසානයට ලියා තබමි.

# යුධ අපරාධ චෝදනා හා රජයේ අපරිණත දේශපාලන පිළිවෙත....

ඒජන්සිකරුවන් ශ්‍රී ලංකාව තම කටගැස්ම බවට පත්කොටගෙන ප්‍රවෘත්ති නිර්මාණය කරමින් තම මාධ්‍ය වෙළඳාම ඉහළින් කරගෙන යති. සදාම් හුසේන් ද්‍රෝහියෙක් කොට ප්‍රභාකරන් වීරයකු ලෙස හොතිස්ම කරනුයේද මෙම මාධ්‍ය වෙළෙන්දන් විසිනි. එබැවින් බලවත් රටවල මෙම දෙබිඩි දේශපාලන න්‍යායපත්‍රය අප පිළිකුලෙන් යුතුව හෙලා දකිමු. එමෙන්ම උක්ත දේශපාලන තෙරපුමට උපක්‍රමිකව මුහුණ දීම වෙනුවට භාව මූලික දේශපාලන පිළිවෙතක් අනුව යමින් ගැටලුව මගහරිමින් සිටින රජයේ දේශපාලන ක්‍රියාවලියද අපගේ පැසසුමට බඳුන් නොවන බව කිව යුතුය.



කොටි සංවිධානය යුධමය වශයෙන් පරාජය වීම බොහෝමයක් කොටි හිතවාදී බලවත් රටවලට සතුට ගෙන දුන් පුවතක් නොවන බව අපි දනිමු. එකල එම **යුධමය ක්‍රියාන්විතයට එරෙහිව පැවති ජාත්‍යන්තර තෙරපුම රජය හොඳින් කළමණාකරණය කරගත් අතර ප්‍රතිඵලය වූයේ යුධ මෙහෙයුම් වැලැක්විය හැකි ජාත්‍යන්තර මැදිහත්මක් ඇති නොවීමයි. රජය සතුව තිබූ එම උපක්‍රමික බව පශ්චාත් යුධ සමය තුළ ඔවුන් වෙතින් ගිලිහී යාම වත්මන් යුධ අපරාධ චෝදනා වෙසින් එන ජාත්‍යන්තර අතපෙවීම් වේගවත් කිරීමට පිටුබලයක් වූ බව මම විශ්වාස කරමි.** රජය යුධ ජයග්‍රහණය තම දේශපාලන ඉදිරි ගමන සුරක්ෂිත කරගැනීම සඳහා මෙහෙය වූවා මිස පශ්චාත් යුධ සමය විසින් ඉල්ලා සිටි බහු වාර්ගික සංහිඳියාව ගොඩ නැගීම සඳහා ප්‍රවේශයක් කොට ගන්නා අයුරක් දැකගත නොහැකි විය.

යුධ ජයග්‍රහණයට උරදුන් පිරිසට නිසි ගෞරවය ලබාදී ඔවුන් හා සහයෝගයෙන් පශ්චාත් යුධ සමයේ අභියෝග ජයගනු වෙනුවට එකී යුධ ජයෙහි කීර්තිය තනිව බුක්ති විඳීමට රජය වෙහෙසෙනු පෙනුනි. එමඟින් එම වටාපිටාව විසින් කිසිසේත් ඉල්ලා නොසිටි දේශපාලන ප්‍රතිමල්ලවයකු නිර්මාණය කරගත් රජය එතැන් සිට ඔහුට එරෙහිව සංවිධානය වීම තම පළමු කාර්යය ලෙස කල්පනා කරනු දක්නට ලැබුණි. එමතු නොව **තම ප්‍රතිමල්ලවයා පරාජයට පත් වූ පසුවද රටේ අනෙක් ප්‍රමුකතා පසෙකට තබා ඔහුට එරෙහිව රාජ්‍ය බලය වැරදිලෙස**

යුධ ජයග්‍රහණය උදෙසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ලබාදුන් නිවැරදි දේශපාලන නායකත්වය ඔහු වෙත සුවිසෙස් කීර්තියක් රැගෙන ආවේය. ඔහු කළ යුතුව තිබුණේ එම කීර්තිය තුළින් ගොඩනැගෙන ජන බලය පරිහරණය කොටගෙන පාර්ලිමේන්තු මැතිවරණයෙදී බුද්ධිමත් පිරිසකට නාමයෝජනා ලබා දී ඔවුන් මැති සබයට පත්කොට එවන ලෙස ජනතාවට ආයාචනා කිරීමයි. මන්ද එවැනි ඉල්ලීමකට ජනතාව අවනත කරගත හැකි තරමේ ජනප්‍රියත්වයක් ඔහු ලබාගෙන තිබුණි. එහෙත් එම සුවිශේෂ අවස්ථාව ඔහු අතින් මග හැරිණි. එහි ප්‍රතිපලය වූයේ මහ මැතිවරණ නාම

**'යේදීම එය මග හැර එතෙක් ගමන්ගත් කුප්‍රකට මාර්ගයටම රජය යළි අවතීර්ණ විය.** ප්‍රභාකරන් මෙල්ල කළ ජනාධිපතිවරයාට මෙම දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ උවමනාවක් නොවුණි. ඔහු වටා එක්රොක්ව සිටින නම ගිය ධාමරිකයන් හා දූෂිතයන්ගේ නාමාවලිය පිළිබඳ විමසීමේදී ඒ බව හොඳින් පැහැදිලි වනු ඇත. එය පැරණි දූෂිත දේශපාලන ගමන තවත් පියවරකින් ඉදිරියට තැබීමක් මිස අනෙකක් නොවේ. අප එවැන්නක් මහින්ද රාජපක්ෂ වැනි කීර්තිමත් දේශපාලන නායකයකුගෙන් කිසිසේත් අපේක්ෂා නොකළද එය එසේ සිදුවූයේ ජාතියේ අවාසනාවටම බව මම කල්පනා කරමි. පශ්චාත් යුධ සමය විසින්




ආයුබෝවන් !
මව් බිමේ හෝ බැහැරව වසන ඔබට අපේම සේවාවන් රැසක්
සුබෝධා Incorporated වෙතින්............
සියලුම ජෝතිෂ්‍ය කටයුතු - නැකැත් සෑදීම,කේන්ද්‍ර සෑදීම/බැලීම,පොරොන්දම් ගැලපීම,අපල උපද්‍රව වලට පිළියම්
Melbourne වාසී ඔබට සියලුම රූප ලාවණ්‍ය අවශ්‍යතා
පරිගනක අලුත්වැඩියාව,වෛරස් ඉවත්කිරීම,දත්ත ආවරනය
ඇතුලු සියලු දෑ..
උත්සව ආවරනය - වීඩියෝ කිරීම සහ සංස්කරණය
ඉදිරියේදී තවත් සේවා රැසක්...........
පිවිසෙන්න අපේ වෙබ් අඩවි 2 වෙත
www.subodha-inc.com.au
www.wix.com/eppingvic/subodhabeauty
දිනපතා රාහු කාලය දැනගන්න
දිනපතා පංචාංගය දැනගන්න
සතියේ/මාසයේ පලාපල
රූප ලාවණ්‍ය තොරතුරු ඇතුලු බොහෝ දෑ.........
03 8401 4180, 0433536097



හැමදාම බ්‍රොයිලර් කාලා ඇතිවෙලාද?
දැන් ගමේ තාලෙට කරි චිකන් මිලට ගන්න
චිකන් මේරිලන්ඩ්
ඩ්‍රම් ස්ටික්
බ්‍රෙස්ට් ෆිලට්
පිකුදු
තෝමස්ටවුන් චිකන් කඩේට වතාවක් ඇවිත් බලන්න
Freshly Processed On Site
- YOUNG ROOSTER
- OLD ROOSTER
- BOILER
- YOUNG CHICKEN
- OLD DUCK
- YOUNG DUCK
- QUAIL
- FRESH EGGS
- DUCK EGGS
- QUAIL EGGS

Many more products available.
Daily specials....*see you soon!*
ALL PRODUCTS SOLD FRESH DAILY


SGM Poultry
PROCESSING PLANT
11 Longview Court,
Thomastown VIC 3074
JAI KRISHNA
Managing Director
Mob: 0411 784 049
Tel: (03) 9466 3906
Fax: (03) 9466 1070